චක්‍රලේඛ අංක 5/96

බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව

නිදහස් චතුරශ්‍රය,

කොළඹ 07.

1996.08.14

බස්නාහිර පළාතේ සියළුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

## සමුපකාර සේවක සේවිකාවන් විශ්‍රාම ගැන්වීම.

බස්නාහිර පළාතේ සමුපකාර සේවයේ නියුතු සෑම සේවක/ සේවිකාවක්ම වයස අවු. 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම යැවිය යුතු ය. ඔහු/ඇය විශ්‍රාම යවනු ලබන දිනය, එදිනට යටත් පිරිසෙයින් මාස තුනකටවත් කලින් ඔහුට/ ඇයට දැනුම් දිය යුතු ය. එසේ වුවත් යම් හේතුවකින් එසේ දැනුම්දීමට අපොහොසත් වුවහොත් වයස අවු. 60 ඉක්මවා සේවයේ සිටීමට එය හේතුවක් නොවිය යුතු ය. තවද වයස අවු. 55 සම්පූර්ණ වූ සේවකයකුට/ සේවිකාවකට සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැති අවස්ථාවක එසේ කිරීමට හිමිකම් ඇත. ඔහු/ඇය විශ්‍රාම යන දිනය, ඒ දිනයට යටත් පිරිසෙයින් මාස තුනකටවත් කලින් තම සේවා යෝජකයාට දැනුම් දිය යුතු ය. වයස අවු. 55 ඉක්මවා සේවයේ යෙදී සිටීම සඳහා වර්ෂයෙන් වර්ෂය බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් සේවා දීර්ඝයක් ලබාගත යුතු ය. එසේ සේවය දීර්ඝ කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් යාකොට ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර විය යුතු අතර අදාල සේවා යෝජකයාගේ ද නිර්දේශ සහිතව එම අයදුම් පත්‍රය කොමිෂන් සභාව වෙත තුන් මසකට කලින් ඉදිරිපත් කළයුතු බව ද සැලකුව මැනවි.

සේවා දීර්ඝ කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කොමිෂන් සභාව සතුව පවතී. මෙම චක්‍රලේඛනයේ විධිවිධාන ඔබ සමිතියේ සියලුම සේවක/ සේවිකාවන් ගේ දැන ගැනීමට සලස්වන්න. කොමිෂන් සභාවේ නියමය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

මෙයට - විශ්වාසී වූ

පී.ඩී. චන්ද්‍රදාස

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව,

බස්නාහිර පළාත.

පිටපත්:- 1. පොඩ්‍ය, සමුපකාර හා වනිතා කටයුතු අමාත්‍යංශයේ ලේකම් - ගරු ඇමතිතුමා ගේ අවධානයට යොමු කිරීම සඳහා

2. සමුපකාර සංවර්ධන කොමසාරිස් (බ.ප.) - දැ.ගැ.පි.

3. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් (බ.ප.) - දැ.ගැ.පි.

4. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවල ලේකම්වරුන් (දැ.ගැ.පි.